#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina

පුවත්පත් කලාවේදියෙකු විසින් දැන දැනම හෝ හිතාමතා හෝ ජනවාර්ගික හෝ ආගමික අසමගියට හෝ ප්‍රචණ්ඩත්වයට අනුබල නොදිය යුතුය යන්න, ශ්‍රී ලංකා කර්තෘ සංසදයෙන් හඳුන්වා දුන් වෘත්තිය ආචාර ධර්මයන් තුළ අන්තර්ගත වේ. එය එසේ වුවත්, මෙම ආචාර ධර්මය කඩකෙරෙනා අවස්ථාවන් අපට ජනමාධ්‍ය තුළ දැකීමට හැක.

දිවයින පුවත්පතේ පළවූ මෙම ලිපිය ඊට උදාහරණයකි. මෙම ලිපියේ සමස්ත ස්වරය නොසැලකුවද, මෙම අවසන් ඡේදය මගින් එක් ජනකොට්ඨාසයක අන්තවාදීන් විසින් තවත් ජනකොට්ඨාසයක් ඉලක්ක කරගනිමින් සිදුකරන්නේ යැයි පැවසෙන යම් යම් උපක්‍රමයන් විදහා දක්වා ඇත. අපගේ ප්‍රශ්නයන් මේවායි. වඳ පෙති යනුවෙන් යමක් තිබෙනා බව විද්‍යානුකූලව සනාථ වී තිබේද? කාන්තාවන් වඳ බවට පත් කිරීමට වඳ පෙති ඇසුරෙන් යෙදූ උපක්‍රමයන් එකක් හෝ පරීක්ෂණ මගින් සනාථ වී තිබේද? සමාජය රෝගාතුර කරවීම උදෙසා තේ කොළ වලට කසළ තේ මෙන්ම විවිධ රසායනික වස එකතු කිරීම එක් ජනකොටසක් ඉලක්ක කරගනිමින්, අනෙක් ජනකොට්ඨාසය මගින් සිදුකරනා බවට පරීක්ෂණයන්ගෙන් සනාථ වී ඇතිද? එසේ සනාථ වී ඇතිනම්, මෙම ප්‍රකාශයන්ගේ විශ්වාසනීයත්වය වෙනුවෙන් නිවැරදි මූලාශ්‍රයන් සඳහන් කොට නොමැත්තේ මන්ද?

මෙම ප්‍රකාශයන් සඳහා මූලාශ්‍රයන්, පරීක්ෂණ වාර්තාවන් ඇසුරෙන් විශ්වාසනීයත්වයක් නොලැබෙන්නේ නම්, මේවා ජනවාර්ගික හෝ ආගමික අසමගියට අනුබල දෙන ආචාර ධර්ම විරෝධී ප්‍රකාශයන් පමණක් නොවන්නේද?

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?